# <u>මුදල් කොමිෂන් සභාවේ කාර්තුමය කාර්ය සාධන වාර්තාව</u>

(2019 අප්‍රේල් 01 වන දින සිට 2019 ජුනි 30 වන දින දක්වා)

## 1. ඉදිරි වර්ෂයේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන අවශ්‍යතා පිළිබඳ අයවැය මාර්ගෝපදේශ පළාත් සභා වෙත නිකුත් කිරීම

මුදල් කොමිෂන් සභාව විසින් පළාත්වල ප්‍රාග්ධන හා පුනරාවර්තන අරමුදල් අවශ්‍යතා තක්සේරුව සම්බන්ධයෙන් පළාත් සභා බලධාරීන් වෙත වාර්ෂිකව මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ. 2020 වර්ෂයේ අවශ්‍යතා තක්සේරුව සඳහා මුදල් කොමිෂන් සභාව විසින් සකස් කරන ලද විස්තරාත්මක මාර්ගෝපදේශ ඇතුළත් වාර්තාව අවශ්‍ය ඇමුණුම් සහිතව සියලුම් පළාත් සභා ලේකම්වරුන් වෙත යවා ඇත.

මුදල් කොමිෂන් සභාවට පළාත් අරමුදල් අවශ්‍යතා තක්සේරුව ඉදිරිපත් කිරීම ඵලදායී ආකාරයෙන් සිදු කිරීම සඳහා අදාල මාර්ගෝපදේශයට විධිමත් ආකෘති පත්‍ර ඇතුළත් කර ඇත.

2020 මූල්‍ය වර්ෂය සඳහා පුනරාවර්තන වියදම් පිළිබඳ පළාත් අවශ්‍යතා තක්සේරු කිරීම සඳහා සම්පූර්ණ කරන ලද ආකෘතීන් සියලුම පළාත්වලින් ලැබී ඇති අතර, තක්සේරු කිරීමේ කාර්යය මේ වන විට ආරම්භ කොට ඇත. පළාත් සභා පහක ප්‍රාග්ධන අවශ්‍යතා පිළිබඳ වාර්තා ජුනි මස අග භාගයේ දී ඉදිරිපත් කර ඇති අතර, ඉතිරිය ලැබෙමින් පවතී. අවශ්‍යතා තක්සේරු කිරීම අගෝස්තු මාසය තුළ සම්පූර්ණ කිරීමටත් අගෝස්තු මස අවසන් වන විට නිර්දේශ සකස් කිරීම අවසන් කිරීමටත් අපේක්ෂා කෙරේ.

## 2. පළාත් වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කිරීම - 2019

සියලුම පළාත් සභාවන්හි වාර්ෂික සංවර්ධන සැලසුම් මුදල් කොමිෂන් සභාව වෙත ලැබුණු අතර, මුදල් කොමිෂන් සභාව විසින් මෙම සැලසුම් අධ්‍යයනය කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයින්, ලේකම් සහ අදාල නිලධාරීන් ඇතුළුව ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යන අයගෙන් සමන්විත කණ්ඩායමක් විසින් බස්නාහිර, උතුරු, මධ්‍යම, සබරගමුව, නැගෙනහිර, උතුරු මැද හා වයඹ යන පළාත් සභාවන්හි වාර්ෂික සංවර්ධන සැලසුම් සහ දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති කිහිපයක් සමාලෝචනය කරන ලදී. මෙම සමාලෝචන රැස්වීම් සඳහා ප්‍රධාන ලේකම්වරු, පළාත් ලේකම්වරු, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ පළාත් සභාවල අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ද සහභාගි වූහ.

පළාත් සභා නවයෙහිම 2019 වර්ෂය සඳහා වූ වාර්ෂික සංවර්ධන සැලසුම් සමාලෝචනය කරන ලද අතර, සමාලෝචන රැස්වීම්වල දී එකඟ වූ පරිදි ඇතැම් සංශෝධනවලට යටත්ව සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා එකඟතාවය ලබාදී ඇත.

## 3. පළාත් සභා සඳහා අතිරේක අයවැය ප්‍රතිපාදන වෙන් කිරීම

පුනරාවර්තන අයවැය යටතේ අතිරේක ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා පළාත් සභා විසින් මුදල් කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කොට ඇත. කොමිෂන් සභාව විසින් 2019 වර්ෂයේ ජුනි 25 දින වන විට එවැනි ඉල්ලීම් 08 ක් සමාලෝචනය කර අදාල නිර්දේශ ජාතික අයවැය දෙපාර්තමේන්තුවට යොමු කර ඇත. තවත් ඉල්ලීම් තුනක් සමාලෝචන ක්‍රියාවලිය තුළ තවදුරටත් කරුණු පැහැදිලි කරගැනීම උදෙසා අදාල පළාත් සභා වෙත යොමු කොට ඇත.

## 4. මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත

මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් නීතිපති දෙපාර්තමේන්තුව හා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව සමග පවත්වන ලදී. නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලැබුණු උපදෙස් පරිදි මුදල් කොමිෂන් සභාවේ සංශෝධිත පනත් කෙටුම්පතට ඇතුළත් කළ යුතු වැදගත් අංග ලැයිස්තුවක් ඔවුන් වෙත ඉදිරිපත් කරන ලදී. පනත් කෙටුම්පත නුදුරේදී ම ඉදිරිපත් කළ හැකි වීමත් සමගම නීතිපති දෙපාර්තමේන්තුව සමග කරනු ලබන සාකච්ඡාවන් අවසන් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5. මුදල් කොමිෂන් සභාවේ දත්ත පද්ධතිය සහ කළමනාකරණ තොරතුරු පද්ධතිය

පුනරාවර්තන වියදම් සඳහා වූ කළමනාකරණ තොරතුරු පද්ධතිය නිර්මාණය කිරීමේ ක්‍රියාවලියෙහි පළමු අදියර දැනටමත් අවසන් කර ඇති අතර, පළමු මූලාදර්ශය එහි සංවර්ධන කටයුතු සිදු කරන "තීක්ෂණ" සමාගම විසින් නිර්මාණය කොට මුදල් කොමිෂන් සභාවේ අදහස් සහ යෝජනා සඳහා ඉදිරිපත් කොට ඇත. සංවර්ධිත කළමනාකරණ තොරතුරු පද්ධතිය පිළිබඳව "තීක්ෂණ" සමාගම විසින් 2019 මැයි 02 දින මුදල් කොමිෂන් සභාවේ සියලුම විධායක නිලධාරීන් සහ සහකාර පර්යේෂණ නිලධාරීන් වෙත ඉදිරිපත් කිරීමක් සිදු කරන ලදී. මුදල් කොමිෂන් සභාවේ 2020 පළාත් පුනරාවර්තන අයවැය තක්සේරු කිරීම සඳහා පද්ධති සංවර්ධකයාගේ සහාය ඇතිව මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය භාවිතා කරන ලදී.

## 6. මුදල් කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2018

මුදල් කොමිෂන් සභාවේ 2018 වර්ෂය සඳහා වූ භාෂාත්‍රයෙන්ම සකස් කරන ලද වාර්ෂික වාර්තාව සහ කැබිනට් සංදේශය සඳහා අවශ්‍ය, පහත සඳහන් ඇමුණුම් ත්‍රිත්වය සමග 2019 ජූනි 19 වන දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලදී.

- 2018 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව
- 2018 වර්ෂය සඳහා විගණන විමසුම් සහ නිවැරදි කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග
- කාර්යසාධනය ඉහළ නැංවීම සඳහා මුදල් කොමිෂන් සභාව අනුගමනය කළ යුතු මධ්‍යකාලීන පියවරයන්ගේ සාරාංශය.

## 7. මුදල් කොමිෂන් සභාවේ කාර්යසාධන වාර්තාව

මුදල් කොමිෂන් සභාවේ 2018 ඔක්තෝබර් 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා වූ කාලයට අදාල කාර්යසාධන වාර්තාව (කාර්තුමය කාර්යසාධන වාර්තාව) සහ 2018 වර්ෂයේ ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා වූ කාලයට අදාල කාර්යසාධන වාර්තාව (වාර්ෂික කාර්යසාධන වාර්තාව) පිළිවෙලින් 2019 අප්‍රේල් 08 සහ මැයි 27 යන දෙදින තුළ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම වසරේ පළමු කාර්තුවේ කාර්යසාධන වාර්තාව ව්‍යවස්ථාදායක සභාව වෙත 2019 අප්‍රේල් 29 වන දින ඉදිරිපත් කරන ලදී.

## 8. උපායමාර්ගික සැලැස්ම නැවත ඉදිරිපත් කිරීම

මුදල් කොමිෂන් සභාවේ උපායමාර්ගික සැලැස්ම සමාලෝචනය කර යාවත්කාලීන කර ඇත. මුදල් කොමිෂන් සභාවේ කාර්යමණ්ඩලයේ සහභාගිත්වයෙන් පැවති ඒ හා සම්බන්ධ සාකච්ඡා මාලාවකින් අනතුරුව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

## 9. පළාත් විගණන වාර්තාව පිළිබඳව නිරීක්ෂණයන් සකස් කිරීම

2017 මූල්‍ය වර්ෂය සඳහා විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන ලද බස්නාහිර, උතුරු හා ඌව යන පළාත්වල විගණන වාර්තා මුදල් කොමිෂන් සභාව වෙත ලැබී ඇති අතර, මෙම වාර්තා සමාලෝචනය තුළින් අනාවරණය වූ විගණන සොයාගැනීම්වල විශේෂ කරුණු කොමිෂන් සභා රැස්වීමේ දී සභාගත කිරීමෙන් අනතුරුව පසු විපරම් කටයුතු සඳහා විගණකාධිපති, පළාත් ආණ්ඩුකාරවරුන්, ප්‍රධාන ලේකම්වරුන් හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සහ පළාත් පාලන ආයතන වෙත යොමු කරන ලදී.

## 10. මානව සම්පත් ප්‍රතිපත්තිය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 හි මග පෙන්වීම යටතේ 2019 වර්ෂය සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ කුසලතා, ආකල්ප, කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පරිපාලන අංශය විසින් සකස් කරන ලදී. සංශෝධිත උපායමාර්ගික සැලැස්මට අනුව මෙය සමාලෝචනය කිරීම අපේක්ෂා කෙරේ.

## 11. වැඩ අධ්‍යයනය

පසුගිය කාර්තු වාර්තාවේ සඳහන් වූ පරිදි, කොමිෂන් සභාවේ කාර්යයන් විධිමත් කිරීම සහ ඵලදායීතාවය ඉහළ නැංවීමේ අරමුණින් වැඩ අධ්‍යයනක් සිදු කිරීමට පියවර ගන්නා ලදී. මේ පිළිබඳ සාකච්ඡා මාලාවක් ආසියා පදනම සමග පවත්වා ඇති අතර, තුන්වන කාර්තුවේ දී ඒ පිළිබඳ අදහස් දැක්වීමට අපේක්ෂා කෙරේ.

## 12. පළාත් පහක මධ්‍යකාලීන තිරසාර සංවර්ධන සැලසුම් විශේෂ කමිටුවට ඉදිරිපත් කිරීම

ඌව, වයඹ, උතුරු මැද, සබරගමුව සහ මධ්‍යම යන පළාත් සභා පහ විසින් සකස් කරන ලද පස් අවුරුදු මධ්‍ය කාලීන තිරසාර සංවර්ධන සැලැස්මක් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තාක්ෂණික සහයෝගය ඇතිව විශේෂඥ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. මෙම විශේෂඥ කමිටුව මුදල් කොමිෂන් සභාවේ සාමාජිකයින්, ලේකම්තුමා ඇතුළුව පළාත් සභා හා පළාත් පාලන ජාතික අමාත්‍යාංශයේ ලේකම්, තිරසාර සංවර්ධන සභාවේ අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය හා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නියෝජිතයින්, අදාල පළාත් සභාවල නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන් (සැලසුම්) සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මුදල් කොමිෂන් සභාවේ නියෝජිතයින් ඇතුළු නිලධාරි මණ්ඩලයකින් සමන්විත විය.

අදාල සැලසුම් පළාත්වල සමස්ත මධ්‍ය කාලීන සැලසුම් වශයෙන් පිළිගැනීමත් එම සැලසුම් තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා එම විශේෂඥ කමිටුවෙන් වටිනා අදහස් ලබාගැනීමත් සඳහා වූ සංසදයක් විය. මෙම සැලසුම් සකස් කිරීමේ උපදේශක මණ්ඩල විශ්වවිද්‍යාල අධ්‍යයන සාමාජිකයින්ගෙන් හා පළාත් ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩල සාමාජිකයින්ගෙන් සමන්විත වී තිබිණ.

## 13. තුලිත ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ අධ්‍යයනය සඳහා වූ කාර්යභාරය සකස් කිරීම

2019 මාර්තු 08 වන දින තුලිත ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ සාකච්ඡාවක් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සහභාගිත්වයෙන් මුදල් කොමිෂන් සභාවේ දී පවත්වන ලදී. ඒ අනුව, මෙහෙයුම් කමිටුව විසින් සකස් කරන ලද විමර්ශන කොන්දේසි (TOR) පාලන කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. යෝජිත මෙම පාලන කමිටුව සඳහා මුදල් කොමිෂන් සභාවේ සභාපති සහ ලේකම්තුමා ඇතුළුව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය මූල්‍ය හා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂ ජනරාල්වරුන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික පර්යේෂණ හා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවල නියෝජිතයින්ගෙන් සමන්විත විය.

## 14. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමන් සමග සිදු කරන ලද සාකච්ඡාව

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමග 2019 මැයි 27 වන දින ග්‍රාමීය ණය පහසුකම් පිළිබඳව සාකච්ඡාවක් පවත්වන ලදී. මෙම සාකච්ඡාව මුදල් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂවරුන් හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

## 15. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (SLILG) සමග ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යයනය

මුදල් කොමිෂන් සභාව සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය හා එක්ව ඒකාබද්ධ පර්යේෂණ අධ්‍යයන දෙකක් 2019 වර්ෂය සඳහා දියත් කර ඇත.

මෙම පර්යේෂණයන්ගෙන් සුදුසු පර්යේෂණයක් ස්වාධීන ඇගයීමක් මගින් තෝරා ගැනීම සඳහා 2019 වර්ෂයේ ජූලි 24 වන දින රැස්වීමක් පවත්වන ලදී.

## 16. විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම

2019 ජූනි 26 වන දින දෙවන කාර්තුවේ විගණන වාර්තාව පිළිබඳ සාකච්ඡාව පවත්වන ලද අතර සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබීය.

## 17. අභ්‍යන්තර විගණන ප්‍රඥප්තිය

මුදල් කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණන ප්‍රඥප්තියක් සකස් කර ඇති අතර, අභ්‍යන්තර විගණන අංශය විසින් අනුගමනය කළ යුතු මෙහෙවර, විෂය පථය, අධිකාරිය, ස්වාධීනත්වය සහ වගකීම යන ආචාරධර්ම යන කරුණු පිළිබඳව මෙහි ඇතුළත් කරන ලදී.

## 18. කාර්යමණ්ඩලයේ ධාරිතා වර්ධනය

- ආරාධිත දේශන
  පහත සඳහන් ආරාධිත දේශන මුදල් කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය සඳහා ඉදිරිපත් කරන ලදී.

| | නම | මාතෘකාව | දිනය |
|---|---|---|---|
| 1 | මහාචාර්ය අජිත් ද අල්විස් මහතා | නිර්මාණාත්මක චින්තනය | 2019.05.24 |
| 2 | ආචාර්ය දිනේෂ් ආටිගල, ආචාර්ය ශාන්ත අමරසිංහ මහතා හා වෙරගොඩ මහතා - මොරටුව විශ්වවිද්‍යාලය | ද්‍රව්‍ය විද්‍යාව සහ ආර්ථිකය | 2019.05.27 |
| 3 | ආචාර්ය අජිත රෝහණ කොලොන්න මහතා | සාර්ථකත්වය | 2019.06.25 |

- කාර්යමණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය (දේශීය පුහුණු)
  මෙම කාලසීමාව තුළ පහත සඳහන් නිලධාරීන් තෝරාගෙන පුහුණු වැඩසටහනට සහභාගිවී ඇත.

| | නම | මාතෘකාව | දිනය |
|---|---|---|---|
| 1 | ඩබ්.ඩී.ඩී,ඉරේෂිකා මිය | ගබඩා සහ භාණ්ඩ තොග කළමනාකරණය | 2019.04.25, 26 |
| 2 | විජිතා අබේවික්‍රම මිය | ගබඩා සහ භාණ්ඩ තොග කළමනාකරණය | 2019.04.25, 26 |
| 3 | එස්.එන්.සංජීවනී මිය | විධායක නිලධාරීන් සඳහා වූ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි | 2019.06.06, 13, 20 |

- පෙර සඳහන් කර ඇති පරිදි මානව සම්පත් සංවර්ධන සැලැස්ම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 අනුකූලව සකස් කොට ඇත.

## 19. සම්මන්ත්‍රණ හා රැස්වීම්වලට සහභාගී වීම

මුදල් කොමිෂන් සභාවේ සභාපති, ලේකම් සහ ජ්‍යෙෂ්ඨ කාර්යමණ්ඩලය පහත සඳහන් රැස්වීම් / වැඩමුළු සඳහා සහභාගී වූහ.

- **ලෝක බැංකුව විසින් අරමුදල් සපයනු ලබන සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය**
  ශ්‍රී ලංකාවේ මධ්‍යම ආදායම්ලාභී සහ ඉහළ ආදායම්ලාභීන්ගේ අධ්‍යාපන ක්‍රමය ජාත්‍යන්තර සංවර්ධනයන්ට සමගාමීව සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, කළමනාකාරිත්වය ශක්තිමත් කිරීම හා ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපන ක්‍රමය නවීකරණය කිරීම යන අරමුණු සහිතව 2018 දී දියත් කරන ලද මෙම සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEM) සඳහා ලෝක බැංකුව විසින් ඇමරිකානු ඩොලර් මිලියන 100 ක ප්‍රදානයක් ලබාදී ඇත. මෙම ව්‍යාපෘතිය 2018-2024 අතර කාලය තුළ ක්‍රියාත්මක කෙරේ.

  ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනයෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ කළමනාකාරිත්වය ශක්තිමත් කිරීම, ව්‍යාපෘති මෙහෙයවීම සහ තාක්ෂණික සහාය ලබාදීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචක වේ.

මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජිකයින් 48 දෙනෙකුගෙන් යුත් පාලන කමිටුවක් පත් කර ඇති අතර, මුදල් කොමිෂන් සභාවේ සභාපතිවරයා මෙම පාලන කමිටුවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කරයි. මෙම පාලන කමිටු රැස්වීම් කාර්තුමය වශයෙන් පවත්වනු ලැබේ.

- **මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සාකච්ඡාව**

  මුදල් කොමිෂන් සභාවේ සභාපති සහ ලේකම් ඇතුළු නිලධාරීන් කිහිපදෙනෙකුගේ සහභාගිත්වයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ දී මුදල් කොමිෂන් සභා පනත් කෙටුම්පත සම්බන්ධ සාකච්ඡාවක් පවත්වන ලදී. මෙම සාකච්ඡාවේ දී පනත් කෙටුම්පතෙහි ඇති ඉතා වැදගත් අංගයන් ලැයිස්තුගත කර නීතිපති දෙපාර්තමේන්තුවේ සලකා බැලීම සඳහා යොමු කිරීමට තීරණය කරන ලදී.

- **නව පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය**

  මෙම ව්‍යාපෘතියේ අරමුණ වනුයේ පළාත් මාර්ගවල ප්‍රවේශය සහ වත්කම් කළමනාකරණය වැඩිදියුණු කිරීමේ හා පළාත් මාර්ග ආයතනවල පද්ධතීන් සහ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමයි. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන කොටස් දෙකක් අන්තර්ගත වේ. එනම්, පළාත් මාර්ග වැඩසටහන් මූල්‍යකරණය හා වත්කම් කළමනාකරණය හා මාර්ග ආරක්ෂාව හා ආයතනික ශක්තිමත්භාවය ඇති කිරීම වේ. පළාත් මාර්ග වැඩසටහන් මූල්‍යකරණය යටතේ සියලුම පළාත්හි පළාත් ප්‍රමුඛතා මාර්ග කි.මී. 500 ක් පමණ ඉදිකිරීම සහ පුනරුත්ථාපනය වැඩිදියුණු කිරීම වසර 05 ක නඩත්තු කාලසීමාවක් යටතේ සිදු කිරීමට අපේක්ෂා කෙරේ. වත්කම් කළමනාකරණය යටතේ මාර්ග ආරක්ෂව සහ ආයතනය ශක්තිමත් කිරීමේ අංග ඇතුළත් වන අතර, වත්කම් කළමනාකරණය හා මාර්ග ආරක්ෂාව සඳහා වූ සැලකිල්ල වැඩිදියුණු කිරීම මගින් කෘෂිකාර්මික / සැපයුම් වටිනාකම් දාමය සහ ආයතනික ධාරිතාව සඳහා සම්බන්ධතාවයක් ඇති කිරීමට අපේක්ෂා කෙරේ.

- **ශ්‍රී ලංකාවේ දිවා සුරකුම් මධ්‍යස්ථාන සඳහා ජාතික මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ රැස්වීම**

  2019 මැයි 16 වන දින ජාතික ළමා ආරක්ෂක අධිකාරිය සහ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය එක්ව සාමූහිකව සකස් කරන ලද මාර්ගෝපදේශ සමාලෝචනය කිරීමේ අපේක්ෂාවෙන් මෙම සාකච්ඡාව ජනාධිපති කාර්යාලයේ දී පැවැත්විණි. එහිදී, වැඩිදුර සලකා බැලීම සඳහා සියලුම පළාත් කොමසාරිස්වරුන්ට ආරාධනා කිරීමට එකඟ විය.

- **සහභාගි වන ලද වැඩසටහන්**

  - ✓ න්‍යායන්ට වඩා අත්දැකීම්වල වැදගත්කම පිළිබඳ සාකච්ඡාව
  - ✓ තුලිත ප්‍රාදේශීය සංවර්ධනය ග්‍රාමීය ණය පහසුකම් වැඩසටහන හා උපායමාර්ග පිළිබඳ සාකච්ඡාව
  - ✓ පළාත් සඳහා අතිරේක අරමුදල් නිර්දේශ පිළිබඳ රැස්වීම
  - ✓ පළාත් සභා පළාත් පාලන ආයතනවල පරිපාලනමය කටයුතු පිළිබඳ සාකච්ඡාව
  - ✓ ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදය වැළැක්වීම සහ ජාතික ආරක්ෂාවට එමගින් ඇති වන බලපෑම

## 20. මුදල් කොමිෂන් සභා රැස්වීම්

- පහත සඳහන් දිනයන්හි කොමිෂන් රැස්වීම් පවත්වන ලදී.
  - ✓ 2019.04.26
  - ✓ 2019.05.25
  - ✓ 2019.06.15
- කොමිෂන් සභා අනු කමිටුව සෑම කොමිෂන් සභා රැස්වීමකටම පෙර රැස්විය.
- සතිපතා විධායක නිලධාරීන්ගේ රැස්වීම පැවැත්විය.